

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# කාර්යය සාධන වාර්තාව 2019




"ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි"

---

**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

දු.ක. 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් :info@revenue.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenue.cp.gov.lk

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (මධ්‍යම පළාත)

## 1. හැඳින්වීම

### 1.1. දැක්ම

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

### 1.2. මෙහෙවර

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

### 1.3. අරමුණු හා කාර්යයන්

**අ)** ආදායම් ඉලක්ක සපුරා ගැනීම

1. 2019 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1750 ක් එකතු කිරීම
2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 0.5ක් එකතු කිරීම
3. ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 5ක් එකතු කිරීම
4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම් රැස්කිරීම

**ආ)** නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

**ඇ)** වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

**ඈ)** තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය

**ඉ)** තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

**ඊ)** යහපාලනය

## 1.4. මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ගැන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන්වන සංශෝධනය මගින් පළාත් සභාව නම් වූ පරිපාලන ඒකකය ආරම්භ වූ අතර, මෙම පළාත් සභාවන් හී ආදායම් කටයුතු සම්බන්ධ කාර්යභාරයන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ 36 වන වගන්තිය යටතේ 36:1 සිට 36:20 දක්වා ඇති උප වගන්ති මගින් පළාත් සභාවන්ට අදාල වූ ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත. ඉහත නෛතික විධිවිධානයන්ට අනුකූලව මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් සම්මත කර ගන්නට යෙදුණු 1990 අංක 17 දරණ මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

ඉහත කී මුදල් ප්‍රඥප්තිය මගින් හා 1996 අංක 03 දරණ මධ්‍යම පළාත් මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය යන ප්‍රඥප්ති මගින් පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනයට යටත්ව බදු හා ගාස්තු මෙන්ම පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය යුතු බදු හා ගාස්තු වර්ග දක්වමින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ විෂය පථය හඳුන්වා දී ඇත. පහත සඳහන් ආදායම් ශීර්ෂ මෙම ප්‍රඥප්ති මගින් දක්වා ඇත.

- පිරිවැටුම් බද්ද
- මුද්දර ගාස්තුව
- ඔට්ටු බද්ද
- ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද
- මෝටර් ප්‍රවාහන පනත යටතේ ගාස්තු දණ්ඩන හා බලපත්‍ර ගාස්තු
- අධිකරණ දඩ හා ගාස්තු
- මධ්‍යම පළාත් ලොතරැයි පිළිබඳ බදු
- ඉඩම් හා ගොඩනැගිලි බද්ද
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් සඳහා ගාස්තු
- සුරාබදු ආදායම
- වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු
- පඩි හා මිමි ආඥාපනත යටතේ ගාස්තු
- තෑගි තරග බද්ද

වර්තමානයේ පළාත් ආදායම් කොමසාරිස්වරයාගේ සෘජු පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන බදු හා ගාස්තු

1. පිරිවැටුම් බද්ද -1991 සිට 2010 (4) කාර්තුව දක්වා වූ හිඟ පිරිවැටුම් බදු පමණි.
2. මුද්දර ගාස්තු - 1991 සිට ක්‍රියාත්මක වේ.
3. ඛණිජ අයිතීන් පිළිබඳ බද්ද - 2014 (2) කාර්තුවේ සිට ක්‍රියාත්මක වේ.
4. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ගාස්තු - 2015 නොවැම්බර් සිට ක්‍රියාත්මක වේ.




**පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

අංක 244,
කටුගස්තොට පාර,
මහනුවර.

දු.ක. 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් :info@revenue.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenue.cp.gov.lk

1.5.



## 1.6. කාර්ය මණ්ඩල තොරතුරු

2019-12-31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව හා සටින සංඛ්‍යාව

| තනතුර | අනුමත සංඛ්‍යාව | වැ කේ | සිටින සංඛ්‍යාව | සෘජු බඳවා ගැනීමේ අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| නියෝජ්‍ය ආදායම් කොමසාරිස් | 1 | SL-1 | 1 | |
| තක්සේරුකරු | 14 | SL-1 | 12 | පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු හෝ 2වන පන්තියේ උපාධියක් / වරලත් හෝ එකාබද්ධ ගණකාධිකාරීන් |
| බදු නිලධාරී | 22 | MN-5 | 19 | පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්, / වරලත් ගණකාධිකාර ආවසරික2/ CIMA 3වන මට්ටම |
| සංවර්ධන නිලධාරී | 12 | MN-4 | 12 | |
| රා.කළමනාකරණ සහකාර | 6 | MN-2 | 6 | |
| රියදුරු | 3 | PL-III | 3 | |
| කාර්යාල කාර්ය සහායක | 4 | PL-I | 4 | |
| | | | | |
| **එකතුව** | **63** | | **58** | |

## 2. 2019 වර්ෂයේ සැලසුම් කරන ලද කාර්යයන් හා ඉටුකළ කාර්යයන්

### ආදායම් ඉලක්කය 2019 වර්ෂය

| ආදායම් ප්‍රභවය | | දෙපාර්තමේන්තු ඉලක්කය රුපියල් | පළාත් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය රුපියල් |
|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,750,000,000 | 2,042,000,000 |
| 02 | හිග පිරිවැටුම් බදු | 500,000 | *22,000,000 |
| 03 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද | 5,000,000 | 5,000,000 |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු | 2,800,000 | **11,000,000 |
| 05 | ඔට්ටු බද්ද | 50,000 | 50,000 |
| | එකතුව | 1,758,350,000 | 2,080,050,000 |

* පිරිවැටුම් බදු පැනවීම 2011 වසරේ සිට අත්හිටුවා ඇති අතර අයකර ගැනීමට ඇති මුළු හිග පිරිවැටුම් බදු ප්‍රමාණයද රුපියල් මිලියන 21.8 පමණ වේ. මෙම ප්‍රමාණය තුළ ද නීතිපති උපදෙස් විමසා ඇති මුත් සැලසුම් සකස් කරන දින වන විට පිළිතුරු නොලද රු.මිලියන 5.8 ක් ද, ව්‍යාපාර හා පුද්ගලයින් නොමැති නිසා නිදහස් කිරීමට යෝජිත රු.මිලියන 9 ක් පමණ ද ඇත. එනිසා පිරිවැටුම් බදු සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය ප්‍රායෝගික නොවේ.

** බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ බඩු උකස්ගන්නා ව්‍යාපාර වලින් ලබා ගන්නා ඇප තැන්පතු ආදායමක් ලෙස සැලකිය නොහැකි අතර එය දෙපාර්තමේන්තුවට වගකීමකි. ඇප තැන්පත් මුදල් හා ලියාපදිංචි ගාස්තුව එක් ව්‍යාපාරයක් වෙනුවෙන් අයකරනු ලබන්නේ එක් වරක් පමණක් වන අතර රු. 5000.00ක බලපත්‍ර ගාස්තුව පමණක් වාර්ෂිකව අයකරනු ලබයි. බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරවල කැපී පෙනෙන වර්ධනයක් වාර්ෂිකව අපේක්ෂා කල නොහැකි බැවින් පළාත් අයවැය දෙපාර්තමේන්තුවේ ඉලක්ක ලගාකර ගැනීම ප්‍රායෝගික නොවේ.

### 2019 වර්ෂය තුළදී අරමුණු කරා ළගාවීමේ ප්‍රගතිය


| ආදායම් ප්‍රභවය | | වාර්ෂික ආදායම් ඉලක්කය රුපියල් | 2019 වර්ෂය තත්‍ය ආදායම රුපියල් | ළගා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,750,000,000 | 1,543,340,356 | **88%** |
| 02 | හිග පිරිවැටුම් බදු | 500,000 | 3,740,121 | **748%** |
| 03 | බනිජ අයිතීන් පිළිබඳ බද්ද | 5,000,000 | 4,094,369 | **82%** |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>• බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු<br>• අය කරන ලද දඩ | 2,800,000 | 3,565,000<br>91,000 | **127%** |
| 05 | ඔට්ටු බද්ද | 50,000 | *0 | **-** |
| | එකතුව | 1,758,350,000 | 1,554,830,846 | **88%** |

(* 2019 වසරේ ඔට්ටු බද්ද අයකිරීම අත්හිටුවන ලදී)

### 2019 වර්ෂයේ ඉටුකළ කාර්යයන්

### අ) 2019 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1543 ක් එකතු කිරීම

පසුගිය වසර 8ක පමණ කාලය තුළ මුද්දර ගාස්තු ආදායම විශ්ලේෂණය කිරීමේ දී 2016 වසරේ සිට පරිනත මට්ටමට පත්ව 2018 වසරේ දී උපරිමයකට ළඟා වී එතැන් සිට පහළ යන උපනතියක් පෙන්වයි. සංචාරක ව්‍යාපාරය අරමුණු කරගනිමින් නුවරඑළිය, මහනුවර හා දඹුල්ල නගර ආශ්‍රිතව අසාමාන්‍ය වටිනාකම් වලින් සිදුවූ දේපල හුවමාරුවීම් මුද්දර ගාස්තු ආදායමේ වර්ධනයට වැඩි දායකත්වයක් දැක්වූ අතර 2018 වසරේ අග භාගයේ සිට රටේ ඇතිවූ දේශපාලනික අස්ථාවරත්වය, 2019 අප්‍රේල් මස 21 දින සිදුවූ ත්‍රස්ත ප්‍රහාරය හමුවේ රටේ ආර්ථිකයේ සිදුවූ කඩාවැටීම ආදී කාරණා නිශ්චල දේපල හුවමාරුවටද දැඩි ලෙස බලපෑ අතර 2019 වසරේ ඉලක්කගත ආදායම ළඟාකරගත නොහැකි වීමට ඉහත කාරණා බලපා ඇත. එම අහිතකර තත්වයන් යටතේ වුවද 88%ක ආදායම් ඉලක්ක සපුරා ගනිමින් රු. 1,543,340,356.00ක ආදායමක් රැස්කර දීමට දෙපාර්තමේන්තුව සමත්ව ඇත. රටේ දේශපාලන ස්ථායීතාවය හා සංවර්ධනය අරමුණු කරගත් ආර්ථික ප්‍රතිපත්ති අනුව මුද්දර ගාස්තු ආදායම පරිනත මට්ටමේ වසර කීපයක් පවතිනු ඇතැයි බලාපොරොත්තු විය හැක.




**2.1 රූප සටහන**
**2011 සිට රැස්කරන ලද මුද්දර ගාස්තු ආදායම**

### ආ) පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 0.5ක් එකතු කිරීම

මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් පිරිවැටුම් බද්ද අත්හිටුවීම නිසා වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිඟ හිටි බදු පමණක් අයකර ගැනීම කරන අතර පිරිවැටුම් බදු පැනවීමක් සිදු නොවේ.

2019 වර්ෂයට ඉලක්කගත කළ හිඟ පිරිවැටුම් බදු ආදායම වන රු.500,000/- ක් වූ අතර එම ඉලක්කය අභිබවා 2019 වර්ෂය තුළ රුපියල් **3,740,121.00** ක් රැස් කරගැනීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. හිඟ බදු අයකරගැනීමේ කටයුතු වලදී ගන්නා ලද අධිකරණමය ක්‍රියාමාර්ග වලදී දෙපාර්තමේන්තු නිලධාරීන් දැක්වූ මහත් කැපවීම මේ සඳහා බෙහෙවින් ඉවහල් වී ඇත.

මුළු හිඟ පිරිවැටුම් බදු ශේෂය 2019 වසරේදී රු. 21,814,288/= ක් දක්වා අඩුකර ගැනීමට හැකි වුණද ගොනු 49කට අදාලව ව්‍යාපාර හා පුද්ගලයින් නොමැති නිසා රු. 5,875,353/= ක මුදලක් අය කර ගැනීමට නොහැකි තත්වයේ පවතින බව ස්ථිරව හඳුනාගෙන ඇත. ඉතිරි ගොනුවල ද කටයුතු කරගෙන යාමේදී, ව්‍යාපාර ආයතන නොමැති වීම, පුද්ගලයින් නොමැති වීම, පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමගම බදු ගෙවීමේ අනුකූලතාවය අඩු වීම යන කරුණු මත හිඟ පිරිවැටුම් බදු අයකර ගැනීම ඉතාමත් අසීරු කාර්යයක් වී ඇත.

### ඇ) බනිජ අයිතීන් පිළිබඳ බද්ද රුපියල් මිලියන 5ක් එකතු කිරීම

2019 වර්ෂයේ ඉලක්කගත බනිජ අයිතීන් පිළිබඳ බදු ආදායම වන රු.5,000,000/- ක් වුවද රැස්කරගත හැකිවූ බනිජ බදු ආදායම රු.4,094,369/-කි. 2019 වසරේ රටේ පැවති දේශපාලනික හා ආර්ථික අස්ථාවරත්වය හමුවේ සංවර්ධන කටයුතු වල පැවති මන්දගාමී ස්වභාවය, බනිජ වැලි ගොඩදැමීම සම්බන්ධයෙන් රජය විසින් පනවන ලද නව නීති රීති මෙන්ම පළාත් සභාව මගින් බනිජ බද්ද අයකිරීමේ නෛතික භාවය අභියෝගයට ලක්කරමින් බදු ගෙවන්නන් කිහිපදෙනෙක් අධිකරණමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණව තිබීමත් එම නඩු කටයුත්තේ අවසානයක් මේවනතුරු සිදු නොවීමත් යන කාරණා මත බනිජ බදු ආදායම ද අපේක්ෂිත ඉලක්කය කරා ළඟාවීමට නොහැකි වී ඇත. නව රජයේ ස්ථාවර ආර්ථික ප්‍රතිපත්ති යටතේ 2020 වසරේ අපේක්ෂිත ඉලක්කයන් කරා ගමන් කිරීම දෙපාර්තමේන්තුවේ අරමුණයි.

### ඈ) බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම්

මේ යටතේ දෙපාර්තමේන්තු ඉලක්කය වූ රු. 2,750,000/- අභිබවා 127%ක වර්ධනයක් සමග රු. 3,565,000/- ක බලපත්‍ර හා ලියාපදිංචි ගාස්තුවක් එකතු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. එයට අමතරව ර. 91,000/- ක දඩ ආදායමක් ද 2019 වසරේදී රැස්කර ඇත. මේවන විට බඩු උකස් ගන්නන් සියලු දෙනා විසින්ම ඇප තැන්පතු තැන්පත් කර ඇති අතර, නව ව්‍යාපාරිකයන් සියලුදෙනා විසින් ඇප තැන්පතු වලට අමතරව ලියාපදිංචි ගාස්තු ද ගෙවා අවසන් ය. ඉදිරි කාලයේදී වාර්ෂික බලපත්‍ර ගාස්තු මේ යටතේ ප්‍රධාන ආදායම වනු ඇත.

### ඉ) නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.

පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර,මෙතෙක් අනුමත වී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව
3. කාර්තුවක පිරිවැටුම රු.මිලියන 30 ට අඩු ව්‍යාපාර සඳහා පිරිවැටුම් බද්ද

### ඊ) වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම

- ආදායම් සේවයේ සියලුම නිලධාරීන් සඳහා ඉඩම් මැනීම හා සිතියම්ගතකරණය සම්බන්ධව තෙදින නේවාසික පුහුණු වැඩ සටහනක් දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේදී පැවැත්වීම
- සමූපකාර සංවර්ධන පුහුණු ආයතනය මගින් පවත්වන ලද කාර්යාල ස්වයංක්‍රීයකරණය (Office Automation) සම්බන්ධව පුහුණු පාඨමාලාවක් සඳහා ආදායම් සේවයේ නිලධාරීන් දාහත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී කරවීම
- 2019 වර්ෂය තුළ දී පිරිස් හා පුහුණු අංශය මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩමුළු සඳහා සේවා අවශ්‍යතා අනුව නිලධාරීන් සහභාගී කරවා ඇත.

### උ) තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය

- Web-based පරිගණක වැඩසටහනක් හා E-file Management System එකක් සැදීමේ කටයුතු අවසන් කර ක්‍රියාවට නංවා ඇත.
- නව පරිගණක වැඩසටහන සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල සම්බන්ධ කිරීම සිදු කර ඇත.

### ඌ) තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම

- නව Web-based පරිගණක වැඩසටහනට ගැලපෙන සේ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය නවීකරණය කර යාවත්කාලීනව පවත්වාගෙන යාමෙන් ආකෘති පත්‍ර හා දැන්වීම් මගින් බදු ගෙවන ජනතාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

## 2019 ක්‍රියාකාරී සැලැස්ම සැලසුම අනුව කාර්ය සාධනය

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළඟාවීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය රු.මිලි.1750 | **ආදායම රු.මිලයන** | 1,750 | 1,543 |
| | | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරීම<br>3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරීම | 26000 | 26658 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරීම | 8500 | 9931 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 8500 | 9931 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරීම. (ආකෘති පත්‍ර 300,101 හා 190 මගින්) | 9000 | 11843 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරීම. | | |
| | | ii. මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.90 | රු.මිලි.86 |
| | | iii. දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ස්ථාන පරීක්ෂණ සංඛ්‍යාව. | 1500 | 1488 |
| | | iv. සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම් ගොනු සංඛ්‍යාව | 7000 | 6522 |
| | | 9. තක්සේරු දැන්වීම් නිකුත් කිරීම සහ තක්සේරු සහතික (මත) නිකුත් කිරීම | 1800 | 1628 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | |
| | | 11. තොරතුරු නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 75 | 97 |
| | ඛනිජ අයිතීන් පිළිබඳ බදු අංශය රු.මිලි.5 | **ආදායම රු.මිලයන** | 5,0 | 4,0 |
| | | 1. ඛනිජ බදු වාර්තා නිකුත් කිරීම | 4000 | 4016 |
| | | 2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරීම | 2000 | 1082 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරීම | 1500 | 1522 |
| | | 4. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරීම | 50 | 39 |
| | | 5.ඛනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | |
| | | 6. වාර්තා නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 100 | 21 |
| | බදු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය ගාස්තු හා තැන්පතු රු.මිලි. 2.75 | 1. වාර්ෂික බලපත්‍ර ගාස්තු | රු.මිලි. 2.75 | රු.මිලි.3.56 |
| | අය හා හිඟ බදු අංශය<br>හිඟ පිරිවැටුම් රු.මිලි. 0.5 | 1. අභියාචනා /විරෝධතා විසඳීම<br>ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම | සියල්ලම | |
| | | 2. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු/ ගාස්තු එකතු කිරීම (D 7) | 250 | 178 |
| | | 3. නොගෙවූ හා එකඟතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම. | 50 | 51 |
| | | 4. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | |
| | | 5. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | | |

| | | | | |
|---|---|---|---|---|
| | තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීම් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් එල කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | | දැනුවත් කිරීමේ දැන්වීම් පුවරු සකස් කර ප්‍රදර්ශනය කර ඇත |
| 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.<br>3. ක්‍රියාත්මක කිරීමට වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>4. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනා අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම<br>3. ක්‍රියාත්මක කිරීම | 1 | |
| 3. ධාරිතා සංවර්ධනය | කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම.<br>4.පිරිවැය හඳුනාගැනීම. | | පුහුණු වැඩසටහන් 3ක් සිදුකර ඇත |
| | තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය | 1. කාර්යක්ෂම, ආරක්ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම<br>3. Web Base පරිගණක වැඩසටහනක් සැකසීම | | ක්‍රියාවට නංවා ඇත |
| 4. යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | | |

ඉහත සියලුම දත්තයන් නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරීමෙන් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉහත වගුව සකස්කර ඇත.

### 2.1 2019 වාර්ෂික ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන හා ප්‍රගතිය

2019 වසරේ ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන හා ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

| විස්තරය | ඇස්තමේන්තුව රු. | වැය කළ මුදල රු. | ප්‍රගතිය |
|---|---|---|---|
| 1. දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පිටත බිත්ති තීන්ත ආලේප කිරීම | 1,350,000.00 | 1,350,000.00 | නිමකර ඇත |
| 2. ගොඩනැගිල්ලේ සිව්වන මහලට පිවිසෙන මාර්ගය සකස් කිරීම | 200,050,00 | 189,516.70 | නිමකර ඇත |
| 3. තෙවන මහලේ වැසිකිළි පද්ධතියේ කොටසක් නවීකරණය කිරීම | 299,500.00 | 144,580.80 | නිමකර ඇත |
| 4. දෙපාර්තමේන්තුවේ දුරකථන පද්ධතිය ක්‍රියාවිරහිතව තිබූ බැවින් නව දුරකථන පද්ධතියක් සවිකිරීම | 277,787.00 | 277,787.00 | නිමකර ඇත |
| 5. රෙසෝ යන්ත්‍රයක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, CCTV කැමරා පද්ධතියක් සවි කිරීම | 1,171,595.00 | 1,171,595.00 | රෙසෝ යන්ත්‍ර 01ක්, ඡායා පිටපත් යන්ත්‍ර 01ක් හා CCTV කැමරා පද්ධතියක් සවි කිරීම |
| 6. පරිගණක යන්ත්‍ර, UPS යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම | 277,660.00 | 277,660.00 | පරිගණක යන්ත්‍ර 02ක්, UPS යන්ත්‍ර 03ක් හා මුද්‍රණ යන්ත්‍ර 02ක් මිලදී ගෙන ඇත |

### 2.2 විශේෂ ජයග්‍රහණ

2019 වසරේදී පැවති, 2017 ගිණුම් වර්ෂයට අදාල රාජ්‍ය ආයතනවල මූල්‍ය කළමනාකරණය සහ කාර්යය සාධනය පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් සිදුකරනු ලැබූ ඇගයීම් ක්‍රියාවලියේ දී ද පෙර වසරේදී මෙන් මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව රන් සම්මානයෙන් පුදනු ලැබීය.



**2.2 රූප සටහන**
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් ලද රන් සම්මානය

### 2.3 ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

2019 වර්ෂයේදී ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ සැලසුම් කරන ලද ක්‍රමෝපායන් අනුව කාර්යාලයීය කටයුතු ඉටු කිරීමට උපරිම උත්සාහයක් දරන ලදී.

### 2.4 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

උක්ත වැඩසටහන යටතේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ලැබුණු ආධාර මුදලෙන් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වෘත්තීමය නිපුණතාවය වර්ධනය, නවීන තාක්ෂණය රාජකාරී කටයුතු සඳහා යොදාගැනීම, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල සමග ඍජු සම්බන්ධතා ඇතිකර ගැනීම, යන කාරණා තුළින් පළාතේ ආදායම් ඉපැයීමේ ක්‍රියාවලිය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව කරගත හැකිවන සේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන් සම්බන්ධ විස්තර පහත සටහනේ සැකෙවින් දක්වා ඇත.

| විස්තරය | වැයකළ මුදල රු. | ප්‍රතිලාභ |
|---|---|---|
| • ආදායම් සේවයේ නිලධාරීන් සඳහා ඉඩම් මැනීම හා සිතියම්ගතකරණය සම්බන්ධව තෙදින නේවාසික පුහුණු වැඩ සටහනක් දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේදී පැවැත්වීම | 451,858.52 | ආදායම් සේවයේ සියළුම නිලධාරීන් සහභාගී විය |
| • සමූපකාර සංවර්ධන පුහුණු ආයතනය මගින් පවත්වන ලද කාර්යාල ස්වයංක්‍රියකරණය (Office Automation) සම්බන්ධව පුහුණු පාඨමාලාවක් සඳහා ආදායම් සේවයේ නිලධාරීන් සහභාගී කරවීම | 500,742.05 | ආදායම් සේවයේ නිලධාරීන් 17ක් සහභාගී විය |
| • නව පරිගණක වැඩසටහන සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල සම්බන්ධ කිරීම හා අවශ්‍ය පරිගණක උපාංග මිලදී ගැනීම | 500,000.00 | Web hosting සේවය ලබාගැනීම, පරිගණක යන්ත්‍ර 5ක් මිලදී ගැනීම හා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල සමග ජාලගත සම්බන්ධතාවය ලබාගැනීම |



**2.3 රූප සටහන**
දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේදී පැවති පුහුණු පාඨමාලාවට නිලධාරීන් සහභාගී වෙමින්



**2.4 රූප සටහන**
දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේදී ප්‍රායෝගික වැඩමුළු වලට නිලධාරීන් සහභාගී වෙන අවස්ථාවක්



**2.5 රූප සටහන**
සමුපකාර සංවර්ධන පුහුණු ආයතනය මඟින් පවත්වන ලද කාර්යාල ස්වයංක්‍රීයකරණය (Office Automation) සම්බන්ධ පුහුණු පාඨමාලාවට නිලධාරීන් සහභාගී වෙමින්

2019 වසරේ රටේ පැවති අස්ථාවර වාතාවරණය යටතේ ආදායම් ඉපැයීමේ ක්‍රියාවලිය යම් පසුබෑමකට ලක් වුවද එම අභියෝගයන් හමුවේ දී ඉහතින් පෙන්නුම් කළ කාර්යය සාධනයක් ළඟා කරගැනීම සඳහා මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු කාර්යය මණ්ඩලයෙන්, හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ හිටපු ප්‍රධාන ලේකම්තුමා මෙන්ම වත්මන් ප්‍රධාන ලේකම්තුමිය ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

2019 වසරේ දී ලද අත්දැකීම් ද සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින්, නව රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති වලට යටත්ව, ලබා දී ඇති ආදායම් ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීම අපගේ ඒකායන අරමුණයි.

**ස්තුතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)
පළාත් ආදායම් කොමසාරිස්
මධ්‍යම පළාත